ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. :

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2022.11.22

පැමිණිලි පාර්ශවය : 1. එස්.එම්. මනෝජ් ප්‍රසන්න මයා,
7/1,අළුත් ඔය, අරලගන්විල, පොළොන්නරුව.

2. ලේකම්,
කේ.ඒ.ආර් වීරරත්න මයා,
දැහැමි ගොවි සංවිධානය, දිවුලපතාන.

3. සභාපති,
ඒ.ඩී. ගුණසේන මහතා,
දැහැමි ගොවි සංවිධානය, දිවුලපතාන.

4. සමාජික,
ඩී.ආර්.ගාමිණී මහතා,
දැහැමි ගොවි සංවිධානය, දිවුලපතාන.

වගඋත්තර පාර්ශවය : 1. අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, කොළඹ.

2. නේවාසික ව්‍යාපාර කළමණාකරු,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බී කලපය, වැලිකන්ද.

3. දිසා වන නිළධාරි,
දිසා වන කාර්යාලය, මඩකලපුව.

4. දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව.

<u>පැමිණිලි අංකය : HRC/AP/278/18</u>


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

පැමිණිල්ලේ සැලකිරීම් :-

ඉහත පැමිණිලි පාර්ශවයන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, 'කඩිනම් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ' සංවර්ධනය කෙරුණු මාදුරුඔය වම් ඉවුරේ ඉඩම් ප්‍රතිලාභ නොලැබූ ජනතාව මාදුරු ඔය දකුණු ඉවුරේ 1984 සිට හේන් ගොවිතැන් කරගෙන පදිංචිව සිටියදී එවකට පැවති LTTE ත්‍රස්තවාදී යුද්ධය හේතුවෙන් අදාළ ඉඩම් අත්හැරීමට සිදුවූ බවත්, යුද්ධය අවසන් වීමෙන් පසුව නැවත මාදුරුඔය දකුණු ඉවුරේ කලින් පදිංචිව හේන් ගොවිතැන් කළ ඉඩම්වල 2009 සිට මුලින් සිටි පුද්ගලයන් හා ඔවුන්ගේ දරුවන් පාරම්පරික හේන් ගොවිතැනේ නිරතව සිටින අතර, 2011 සිට මඩකලපුව දිසාවන නිලධාරි ඇතුළු වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ නිළධාරින් හා 2016 සිට නේවාසික ව්‍යාපාර කළමණාකරු B කලාපය නිලධාරින් ජාතිකත්වය මුල් කරගනිමින් හා පරිපාලන දිස්ත්‍රික්කය මුල්කර ගනිමින් හේන් ගොවිතැන් කළ පුද්ගලයින් එම භූමියෙන් ඉවත් කර එම ඉඩම් මඩකලපුව දිස්ත්‍රික්කයේ ගව පාලනයේ නියුතු අය වෙත ලබාදෙමින් සිටින බව දන්වා ඇත. එමඟින් හේන් ගොවිතැන් කරගෙන පදිංචිව සිටි 'දැහැමි ගොවි සංවිධානයේ' සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව දන්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ සැලකිරීම් :-

දිසා වන නිලධාරි මඩකලපුව 2018.02.22 දිනැතිව වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් පැමිණිල්ල සඳහන් කරන මාදුරුඔය දකුණු ඉවුර යෝජිත සංවර්ධන ප්‍රදේශය 1999 වර්ෂයේ ප්‍රකාශයට පත්කර ඇති විශේෂ මහවැලි බල ප්‍රදේශයක් බව දන්වා ඇත. ඊට ප්‍රථම එම ඉඩම් ඔමුනුගල රක්ෂිතයට හා තොප්පිගල යෝජිත රක්ෂිතයට අයත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පැවති බවත් සඳහන් කර ඇත.

පැමිණිලි පාර්ශවය තමන් පදිංචිව සිටි බව පවසන හා පසුකාලීන හේන් ගොවිතැන් කළ බව පවසන භූමිය මෙම දකුණු ඉවුර සංවර්ධන යෝජනා ක්‍රමයට ඇතුළත්අ වන බවත්, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ප්‍රදේශයේ මැනුම් කටුයුතු හා ගස් ඉවත් කීරීම 1984 වර්ෂයේ සිට මහවැලි අධිකාරිය විසින් සිදුකර යුධමය තත්වය හේතුවෙන් නතර කර තිබි යුධ ගැටුම් අවසන් වීමෙන් පසුව 2010 වර්ෂයේ මඩකලපුව දිසා වන නිළධාරි විසින් එහි ආරක්ෂණ කටයුතු වල යෙදී ඇති අතර, 2011 වර්ෂයේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන කටයුතු නැවත ආරම්භ කර මැනුම් කටයුතු සිදුකර ඇති බවත්, එම යෝජිත සංවර්ධන කලාපය අතහැර තොප්පිගල වනය ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ල සිය පැමිණිල්ල මඟින් දක්වා ඇති හේන් ගොවිතැන් කළ පුද්ගලයන් ඉවත් කලා සේ දක්වා ඇත්තේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ඔමුනුගල හා තොප්පිගල වනාන්තර වලට අනවසරයෙන් ඇතුලු වී හේන් වගාකල පුද්ගලයන් වන බවත්, ඔවුන් අත්අඩංගුවට ගෙන 2011 වර්ෂයේ සිට නඩු පැවරීම් සිදුකර ඇති බවත්, නඩු පැවරූ අය අතර, සියලු ජාතීන්ට අයත් පුද්ගලයන් සිටින බවත් දන්වා ඇත. එහිදී ජාතිකත්වය පදනම් කරගෙන කටයුතු කර නොමැති බවද වැඩිදුරටත්

දන්වා ඇත. මඩකලපුව, අම්පාර, පොළොන්නරුව දිස්ත්‍රික්කවල වර්ෂා ජලයෙන් කුඹුරු ගොවිතැන් කරන කාලයට ගවයන් වනාන්තරවල පවතින තෘණ භූමිවලට ඇතුළු කිරීමට ඒ දිස්ත්‍රික්කවල කෘෂිකර්ම කමිටු හා ප්‍රාදේශීය කෘෂි කමිටු වලදී කරන ලද ඉල්ලීම් අනුව වසරේ සැප්තැම්බර් මස සිට ජනවාරි මාසය දක්වා කාලය තුළ ගවයින් වනාන්තරවල තෘණ භූමිවලට ඇතුළත් කරන බවත්, කිසිදු ගව හිමියකුට වනාන්තරයේ ඉඩම් ලබාදී නොමැති බවත් දන්වා ඇත. එසේම වනාන්තරයට ඇතුළු කරන ගවයන් හෝ ගව හිමියන්ගේ ජාතිකත්වය පිළිබඳ සැළකිලිමත් වී නොමැති බවත්ද දන්වා ඇත.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017.10.29 දිනැතිව අංක 03/2014 දරණ පාරම්පරික හේන් ගොවිතැන් කරන ජනතාව වෙනුවෙන් සහන සැලසීම පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව හේන් ගොවිතැන් සඳහා අවසර ලබාදීමේ ක්‍රමවේදයක් ඇති නමුත්, දිවුලපතාන දැහැමි ගොවි සංවිධානය (පැමිණිලි පාර්ශවය) විසින් එවැනි ඉල්ලීමක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිසා වන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැති බවද දන්වා ඇත.

පැමිණිලිකරුවන් 1972 වසරේ සිට 1984 වර්ෂය දක්වා පදිංචිව සිට 1984 LTTE ත්‍රස්තවාදය හේතුවෙන් පදිංචිය හැර ගොස් 2009 වසරේ සිට හේන් ගොවිතැන් කළ සියලූ ඉඩම් මේ වන විට මහවැලි අධිකාරිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් වන බවත්, අදාළ ඉඩමට පැමිණිලි පාර්ශවයට බලපත්‍ර ලබා දීමක් සිදු කර නොමැති බවත් දක්වා ඇත. ප්‍රශ්නගත ඉඩම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ B කලාපයට අයත් බවත්, ඒවා මහවැලි අධිකාරියේ වැලිකන්ද කොට්ඨාශයෙන් පාලනය වන බවත්, පරික්ෂණයේදි මහවැලි අධිකාරියේ නිලධාරීන් විසින් සඳහන් කර ඇත. එම ඉඩම් යෝජිත මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අයත් බවත්, එම පාරම්පරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අනවසර ගොවීන් ඉවත් කිරීමට කටයුතු කළ බවත්, වැඩිදුරටත් දන්වා ඇත. එසේම යෝජිත මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම භූමියේ පදිංචිව සිටි අයට ඉඩම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ලෙසත් ඔවුන්ට සාධාරණයක් ඉටුකරන බවත් සඳහන් කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ පැවති පරික්ෂණයේදි යෝජිත මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අයත්වන භූමියේ පෙර පදිංචි සිටි බව තහවුරු කර එහි ඉඩම් බෙදාදීම සඳහා ඉඩම් කච්චේරි පවත්වන අවස්ථාවේදි ඉදිරිපත් වන්නේනම් ඔවුනට ප්‍රමුඛතාවය ලබාදිය හැකි බව පරික්ෂණය සඳහා සහභාගි වූ නියෝජ්‍ය නොවාසික ව්‍යාපාර කළමණාකරු ජේ.එම්.එච්.එස්. ජයවර්ධන මහතා සඳහන් කර ඇත. එසේම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූමිය මැන වෙන් කිරීමේදි භූමියේ පදිංචිව සිටි අය ඉන් ඉවත් කිරීම සිදුනොකළ බවත්, එය ජාතිවාදි පදනමක් මත සිදු ක කාර්යයක් නොවන බවත්, අනවසරයෙන් හේන් වගා කළ අය පමණක් ඉවත් කිරිම සිදු කර ඇති බවත් දක්වා ඇත.

මඩකලපුව අතිරේක දිස්ත්‍රික් ලේකම් මුකුන්දන් මහත්මිය ප්‍රකාශ කර ඇත්තේ, අදාළ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කර ඇති භූමියෙන් කොටසක් මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් වන බවත්, අදාළ ඉඩම් වල පදිංචිව සිටි බවට පදිංචි සහතිකයක් පැමිණිලි පාර්ශවයට ලබාදීමට නම්

ඡන්ද නාමලේඛනය මඟින් පදිංචිය තහවුරු කළ යුතු බවයි. එසේ තහවුරු කරන්නේනම් පදිංචි සහතික ලබාදීමට හැකි බවත් තමන් ජාතිවාදිව කටයුතු නොකරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදි අනාවරණය වී ඇති කරුණු :-**

1972 වසරේ සිට 1984 වර්ෂය දක්වා පැමිණිලි පාර්ශවය ඇතුළු පිරිසක් යෝජිත 'මාදුරඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට' අයත් 'දිවුලපතාන' නැමැති කොටසේ ස්ථිර පදිංචිය දරා ඇති බව හා 1984 LTTE ත්‍රස්ථවාදි යුද්ධමය හේතුවෙන් එම ගම්මාන අතහැර ගොස් යුධ සමය අවසන් වීමෙන් පසුව 2009 වසරේ සිට එහි හේන් ගොවිතැන්හි නිරතව ඇති බවත් අනාවරණය වේ.මහඔය ප්‍රාදේශීය ලේකම් විසින් 2012.10. දින රහිත ලිපිය මඩකලපුව මන්මුනේ පංගුව(දකුණ) ප්‍රාදේශීය ලේකම් වෙත නිකුත් කර ඇති අතර, එමඟින් දිවුලපතාන ග්‍රාමයේ පුද්ගලයන් පදිංචිව සිටි යුද්ධය හේතුවෙන් ගම් බිම් අතහැර ගිය බව සඳහන් බව අනාවරණය වේ.

පැමිණිලිකරුවන් හට මහඔය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ආරක්ෂාව සැළසිය නොහැකි බැවින් ගම්මානය අතහැර යන ලෙස තමන්ට දැන්වූ බවත්, ඒ බව සඳහන් ලියවිලි පොලිසිය සතුව ඇති බවත් පැමිණිල්ල අනාවරණය කර ඇත.

පැමිණිල්ල ඉදිරිපත් කරන දිවුලපතාන, යක්කාගල, 'දැහැමි ගොවි සංවිධානය',අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ ලි.ප.DAD/16/06/35 යටතේ ලියාපදිංචි ගොවි සංවිධානයක් බව අනාවරණය වේ. එහි සාමාජික සංඛ්‍යාව 314 ක් බවද අනාවරණය වේ.

අදාළ ඉඩම්වල හේන් වගාවේ නියැලි පිරිස් වලට සංරක්ෂණය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සඳහා එම දෙපාර්තමේන්තුවෙන් නඩු පවරා ඇති අතර මහවැලි අධිකාරියේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන වැඩසටහන සඳහා මැන ඇති ඉඩම් සඳහා මහවැලි අධිකාරියද ඉඩම්වලින් නෙරපීම සඳහා නඩු පවරා ඉඩම් වලින් නෙරපීම් කර ඇති බවද, අනාවරණය වේ.

ප්‍රශ්නගත ඉඩම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ 'බී' කළාපය ලෙස 1970.06.18 දිනැති අංක 41 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ දකුණු ඉවුර සංවර්ධන කලාපයට අයත් අතර, එහි සංවර්ධන කටයුතු යුධමය තත්වය මත අඩපන වී ඇති බව නිරීක්ෂණය වේ. 2011 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන් අනුව යලි එම කටයුතු ආරම්භ කිරීමට මූලික කටයුතු සිදුකරමින් පවතින බව අනාවරණය වී ඇති අතර, එහි අනවසර අල්ලා ගැනීම් අත්හිටුවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව හා දිස්ත්‍රික් ලේකම්, අම්පාර වෙත අංක LAP/54B/1/2016/ජුලි/11 දිනැති ලිපියෙන් අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දැනුවත් කර ඇති බවද අනාවරණය වේ.

දිවුලපතාන ග්‍රාමය අම්පාර මහඔය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත්ව ඇති අතර, මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට එම ඉඩම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින බවද අනාවරණය වේ.

පැමිණිල්ලේ සඳහන් කරනුයේ මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් ඇගැයීම් වාර්තාව අනුව මෙය අසාර්ථක ව්‍යාපෘතියක් බව පෙන්වා දී ඇති බවයි.

ප්‍රශ්නගත ඉඩම් වල මේ වන විට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු හා ප්‍රාදේශිය කෘෂි කමිටු වලදි කරන ලද ඉල්ලීම් අනුව වසරේ සැප්තැම්බර් සිට ජනවාරි දක්වා කාලය තුළ ගවයන් ඇතුළු කිරීමට ගව හිමියන්ට ඉඩ සලසා ඇති බව අනාවරණය වේ.

ඉහත අනාවරණය වන සියලු කරුණු අනුව, දිවුලපතාන හික්කාගල ප්‍රදේශවල 1972 සිට 'දැහැමි ගොවි සංවිධානය'ට අයත් ගොවීන් ස්ථිර පදිංචිය දරා ඇති බවත්, ත්‍රස්ථවාදි කලබල හේතුවෙන් 1984 දි එම ප්‍රදේශ වලින් ඉවත්ව ගොස් ඇති අතර, අනතුරුව 1999 වර්ෂයේ සිට නැවත තමන් පදිංචිව සිටි ඉඩම්වලට පැමිණ හේන් වගාවේ නිරතව සිට ඇති බවත්, අදාළ ඉඩම් රජයේ ඉඩම් වන අතර, එම ඉඩම් මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මේ වන විට මැන වෙන්කර ඇති බවත්, එම සංවර්ධන ව්‍යාපෘතියට ඉඩම් හෙක්ටයාර් 63250 ක් අයත් වන බවත් නිරික්ෂණය වී ඇත.

මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අදාළ සංවර්ධන ව්‍යාපෘතියට අයත් ඉඩම්වල දැනට අනවසර පදිංචිය දරණ අය සඳහා ඉඩම් දීමේදී ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන බව වගඋත්තර පාර්ශවීය මහවැලි අධිකාරියේ නිළධාරින් කොමිෂන් සභාවේදී ප්‍රකාශ කර ඇත.

පැමිණිලි පාර්ශවයද 1974 වර්ෂයේ සිට 1984 වර්ෂය දක්වා අදාළ ඉඩම්වල පදිංචිව සිටි බව හා 2009 වසරේ සිට හේන් ගොවිතැන් කළ බව ඔවුන් ඉදිරිපත් කරන ගෘහ මූලිකපත,ජාතික මැලේරියා සමූල නාශක වැඩසටහනේ ලේඛන, පොලිස් පැමිණිලි සටහන්, ග්‍රාම නිළධාරි සහතික ආදිය මඟින් තහවුරු කර ඇත.

ඒ අනුව අදාළ ඉඩම්වල අනවසර පදිංචිකරුවන් පාරම්පරිකව දිගු කාලයක් පදිංචිව සිට තමන්ට පාලනය කළ නොහැකි හේතු මත එම ඉඩම් අත්හැර, මේ වන විට ද ස්ථිර ඉඩම් නොමැතිව ජීවත් වන, පාරම්පරික පදිංචිකරුවන් හා ඔවුන්ගේ අනු පවුල්වල ඥාතින්වද අදාළ සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් ලබා දීමේදි ඉඩම් කොටස් ලබා දිය යුතු බවද නිරික්ෂණය වේ.

**නිර්දේශය :-**

පැමිණිලි පාර්ශවීය 'දැහැමි ගොවි සංවිධාන'යේ සාමාජික ගම්වාසීන් හට මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අයත් අදාළ ඉඩම් ලබා නොදිම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1),14(උ) වගන්තිය මඟින් සහතික කර ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව අනාවරණය වන බැවින්, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ වැඩසටහන යටතේ ඉඩම් ලබාදීමේදි පැමිණිලි පාර්ශවීය දිවුලපතාන දැහැමි ගොවි සංවිධානයේ සාමාජිකයන් වන ගම්වාසීන් හට ඉඩම් ලබාදිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12 . 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

H. M. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
මහවැලි කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය,
ට.බී ජයා මාවත,
කොළඹ 01.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/